රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය

அரசாங்க நிருவாகச் சுற்றறிக்கை

Public Administration Circular

අංක.
இல.
No. } 70

# රාජ්‍ය, පළාත් පාලන සහ සංස්ථා නිලධාරීන් සඳහා දේශපාලන අයිතිවාසිකම් දීම

## அரச, உள்ளூராட்சி, யாக்க உத்தியோகத்தர்களுக்கு அரசியல் உரிமைகள்

## Political Rights for State, Local Government and Corporation Officers

ආයතන චක්‍රලේඛ මාලා අංක
தாபனத் தொடர் இல.
**Establishments Series No.** } 52

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි.

මිළ விலை **Price :** ශත 10 යි    තැපැල් ගාස්තුව தபாற் செலவு **Postage :** ශත 15 යි

මගේ අංකය: 2/9/170 (එච්) බී.
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය,
ටොරින්ටන් චතුරශ්‍රය,
කොළඹ 7, 1973 අගෝස්තු මස 15 දින.

සියලුම ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙතටයි.

**රාජ්‍ය, පළාත් පාලන සහ සංස්ථා නිලධාරීන් සඳහා**
**දේශපාලන අයිතිවාසිකම් දීම**

1970 ඔක්තෝබර් මස 10 වැනි දින අංක 14 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට ඔබගේ අවධානය යොමු කරවනු ලැබේ. ඒ අනුව, පළාත් පාලන මණ්ඩලයක නියෝජිතයකු වශයෙන් තේරී පත්වන රාජ්‍ය සේවකයෙකුට, පළාත් පාලන ආයතනයක රැස්වීම් වලට සහභාගිවීම සඳහා සම්පූර්ණ වැටුප් සහිත නිවාඩු, සේවයේ හදිසි අවශ්‍යතාවන්ට යටත්ව දෙනු ලැබේ. දේශපාලන අයිතිවාසිකම් භුක්ති විඳින පළාත් පාලන සහ සංස්ථා අංශයේ නිලධාරීන් වෙතද මෙම සහනය දීමට රජය දැන් තීරණය කර ඇත.

2. රාජ්‍ය, පළාත් පාලන සහ සංස්ථා නිලධාරීන්ට, සේවයේ හදිසි අවශ්‍යතා සහ විනයානුකූල නියමයන්ට යටත්ව, ඔවුන් තේරී පත්වූ පළාත් පාලන මණ්ඩල කාර්යාලයට කිට්ටු සේවා ස්ථානයක සේවය කිරීමේ සහනය දීමට, රජය විසින් තවදුරටත් තීරණය කර ඇත. මොවුන් එම පළාත් පාලන ආයතනයේ නියෝජිතයන් වශයෙන් සේවය කරනතාක් කල් මාරුවීම් පිළිබඳ සාමාන්‍ය නීතිරීති මෙම නිලධාරීන් කෙරෙහි අදාල නොවේ.

3. ඉහත පලවන ඡේදයෙහි දක්වෙන සහනයෙන් ප්‍රයෝජන ගැනීමට බලාපොරොත්තු වන නිලධාරියෙකු විසින් තම ආයතන ප්‍රධානියාට විධිමත් අයදුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතුය. මාරුවීම් සම්බන්ධයෙන් නම් අයදුම් පත ඉදිරිපත් කළ යුත්තේ අදාල බලධාරියාටය.

4. මෙම චක්‍රලේඛයේ අඩංගු කරුණු කරුණාකර ඔබ අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/සංස්ථාවේ සහ පළාත් පාලන ආයතනයේ සියලුම නිලධාරීන්ගේ දැන ගැනීම පිණිස සලස්වනු මැනවි.

ජී. චන්ද්‍රසිරි.

ලේකම්.
රාජ්‍ය පරිපාලන, පළාත් පාලන සහ
ස්වදේශ කටයුතු පිළිබඳ අමාත්‍යාංශය.